| | | |
|---|---|---|
| සුවෙන් පෙරට<br>ඉගෙනුම් පියස<br>මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය | | ZEOM<br>කලාප අධ්‍යාපන කාර්යාලය - මිනුවන්ගොඩ<br>Zonal Education Office - Minuwangoda |
| | | වාරය - II |
| ශ්‍රේණිය : 6 | විෂයය : සිංහල භාෂාව හා සාහිත්‍යය | පාඩම : 9 - ක්‍රියා පද හා එහි ප්‍රභේද |

# ක්‍රියා පද

" කිරීමක්, සිදුවීමක් හෝ විඳීමක් " ගැන කියවෙන පද ක්‍රියා පද ලෙස හැඳින්වේ.

උදාහරණ :-

(1) ඔවුහු කූඩාරම <u>ගැළවූහ.</u>

(2) ගමන සාර්ථක බව ඔහුට <u>සිතිණි.</u>

(3) වළ පිරිසිදු දියෙන් පිරී <u>තිබුණේ ය.</u>

මෙම වාක්‍යවල " ගැළවූහ, සිතිණි, තිබුණේ ය " යන පද මගින් වාක්‍ය අවසාන කර ඇත. එබැවින් ඒවා ආඛ්‍යාත හෙවත් අවසාන ක්‍රියා ලෙස හැඳින්වෙයි.

ක්‍රියා පදවල ප්‍රභේද හතරක් දක්නට ලැබේ. ඒවා මෙසේ ය.

(1) වචන භේදය

(2) පුරුෂ භේදය

(3) කාල භේදය

(4) ලිංග භේදය

## (1) වචන භේදය

ක්‍රියා පදවල ඒක වචන, බහු වචන ලෙස වචන භේදයක් දක්නට ඇත.

## ක්‍රියා පද

| ඒක වචන | බහු වචන |
| --- | --- |
| කරයි | කරති |
| යයි | යති |
| බලමි | බලමු |
| ගයහි | ගයහු |

උදාහරණ :-

(1) ඔහු ගමට යයි.
(2) ඔවුහු ගමට යති.

ඉහත වාක්‍යවල උක්තය හා ආඛ්‍යාතය දෙස බලන විට උක්තය ඒක වචන නම් ආඛ්‍යාතය ද ඒක වචනයෙන් තබා ඇති බවත්, උක්තය බහු වචන නම් ආඛ්‍යාතය ද බහු වචනයෙන් තබා ඇති බවත් පැහැදිලි වේ. මේ අනුව ක්‍රියා පදවල ඒක වචන ක්‍රියා පද හා බහු වචන ක්‍රියා පද යනුවෙන් වචන භේදය දැක ගත හැකිය.

### (2)පුරුෂ භේදය

ක්‍රියා පදවල උත්තම පුරුෂ, මධ්‍යම පුරුෂ, ප්‍රථම පුරුෂ යනුවෙන් පුරුෂ භේදය දැකිය හැකිය.

## ක්‍රියා පද

| උත්තම පුරුෂ | මධ්‍යම පුරුෂ | ප්‍රථම පුරුෂ |
| --- | --- | --- |
| යමි | ගියෙහි | නටයි |
| යමු | ගියෙහු | නටති |

- උක්තය ලෙස උත්තම පුරුෂ සර්ව නාම පදයක් යෙදෙන වාක්‍යයක ආඛ්‍යාතය (අවසාන ක්‍රියාව) ලෙස භාවිතා කරන ක්‍රියා පදය උත්තම පුරුෂ වේ.

උදාහරණ :-

(1) මම පොත <u>බලමි.</u>

(2) අපි පොත් <u>බලමු.</u>

- උක්තය ලෙස මධ්‍යම පුරුෂ සර්ව නාම පදයක් යෙදෙන වාක්‍යයක ආඛ්‍යාතය ලෙස යෙදෙන ක්‍රියා පදය මධ්‍යම පුරුෂ වේ.

උදාහරණ :-

(1) නුඹ පොත <u>බලහි.</u>

(2) නුඹලා පොත් <u>බලහු.</u>

- උක්තය ලෙස ප්‍රථම පුරුෂ නාම පදයක් යෙදෙන වාක්‍යයක ආඛ්‍යාතය ලෙස යෙදෙන ක්‍රියා පදය ප්‍රථම පුරුෂ වේ.

උදාහරණ :-

(1) ඔහු පොත <u>බලයි.</u>

(2) ඔවුහු පොත් <u>බලති.</u>

## (3)කාල භේදය

ක්‍රියා පදවල අතීත කාල, අනතීත කාල ලෙස කාල භේදය දක්නට ඇත.

උදාහරණ :-

(1) මම පොත <u>බලමි.</u>

(2) මම පොත <u>බලන්නෙමි.</u>

(3) මම පොත <u>බැලුවෙමි.</u>




## (4)ලිංග භේදය

ක්‍රියා පදවල ස්ත්‍රී ලිංග, පුරුෂ ලිංග ලෙස ලිංග භේදය දක්නට ලැබේ.




| | |
|---|---|
| කැඩුවා ය. | කැඩුවේ ය. |
| කළා ය. | කළේ ය. |
| ගැයුවා ය. | ගැයුවේ ය. |

- ස්ත්‍රී ලිංග නාම පදයක් උක්තය ලෙස යෙදෙන වාක්‍යයක ආඛ්‍යාතය ද ස්ත්‍රී ලිංග උක්තයට ගැළපෙන පරිදි යෙදිය යුතු ය.

  උදා :- (1) <u>නංගී</u> මල් <u>කැඩුවා ය.</u>

- පුරුෂ ලිංග නාම පදයක් උක්තය ලෙස යෙදෙන වාක්‍යයක ආඛ්‍යාතය ද පුරුෂ ලිංග උක්තයට ගැළපෙන පරිදි යෙදිය යුතු ය.

  උදා :- (1)<u>මල්ලී</u> මල් <u>කැඩුවේ ය.</u>

- ලිංග භේදයට අනුව වර්ග කළ හැක්කේ ප්‍රථම පුරුෂයට අයත් ක්‍රියා පද පමණි.
- නමුත් සිංහල භාෂාවේ එන සමහර ක්‍රියා පදවල ලිංග භේදයක් දක්නට ලැබුණ ද බොහෝ ක්‍රියා පදවල ලිංග භේදයක් දක්නට නැත.

උදා :- (1)ගස බිමට <u>වැටෙයි.</u>
(2)දැරිය බිමට <u>වැටෙයි.</u>
(3)දරුවා බිමට <u>වැටෙයි.</u>

➢ පාඩම ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

01. පහත දැක්වෙන වාක්‍යයන්හි උක්ත පදවල ඒක වචන, බහු වචන භේදය සැලකිල්ලට ගෙන හිස්තැනට ගැළපෙන ආඛ්‍යාත පද ලියන්න.

1. මම ගෙදර වැඩ සියල්ල නිමා ........................
2. වඳුරු රංචුව වතුර සොයා ඈතට ...........................
3. කුහුඹුවෝ වැස්සට පෙර කෑම රැස් ..........................
4. බල්ලා සොරා පසුපස ..........................
5. මිතුරෝ මා බලන්නට ...........................
6. ගොවියෝ කුඹුරු ...............................
7. අම්මා දරුවාට කිරි ..............................
8. තොපි හෙට දහම් පාසල් ...........................
9. වඩුවෝ පුටු ...........................
10. වෛද්‍යවරයා රෝගියා සුව ....................

02. පහත සඳහන් ඒක වචන වාක්‍යය බහු වචනයෙන් ලියන්න. (සියලු ම පද බහු වචන විය යුතු ය.)

1. මිනිසා ගවයා සොයයි.
   ......................................................................
2. මම පොත බලමි.
   .......................................................................
3. නුඹ ඔහු දුටුවෙහි.
   .........................................................................

4. කුරුල්ලා අහසේ පියාසර කරයි.

 ......................................................................

5. භික්ෂුව දහම් දෙසයි.

 ......................................................................

03. පහත සඳහන් ක්‍රියා පදවලට අදාළ පුරුෂ භේදය හා වචන භේදය ඉදිරියෙන් ලියන්න.

| ක්‍රියා පදය | පුරුෂ භේදය | වචන භේදය |
|---|---|---|
| ආවෙමි | උදා. උත්තම පුරුෂ | උදා. ඒක වචන |
| නරඹහු | | |
| බෙදති | | |
| දුවමු | | |
| හැඬුවේ ය | | |
| විමසයි | | |
| ගියහ | | |
| පීනමු | | |
| කරහි | | |
| වැපුරුහ | | |

04. පහත සඳහන් අතීත කාල වාක්‍යය වර්තමාන කාලයට හරවා ලියන්න.

1. අපි පන්සල් ගියෙමු.

 ..................................................................

2. තෝ ගීයක් ගැයුවෙහි.

 ..................................................................

3. ගායිකාව ගීයක් ගැයුවා ය.

 ..................................................................

4. කුරුල්ලෝ පණුවන් කෑහ.

 .................................................................

5. වඩුවෝ පුටු සෑදූහ.

 .................................................................

05. පහත ක්‍රියා පද අතීත කාල ද අනතීත කාල ද යන්න ලියා දක්වන්න.

| ක්‍රියා පදය | කාල භේදය |
|---|---|
| බලමි | උදා. අනතීත කාල |
| නිදා ගත්හ | |
| ගියේ ය | |
| දුටුවෙහු | |
| දුවන්නීය | |
| තනයි | |
| ලියුවේ ය | |
| කඩා දමති | |
| නැරඹුවෙමු | |

06. පහත සඳහන් වාක්‍යයන්හි උක්ත පදවල ලිංග භේදය සැලකිල්ලට ගනිමින් හිස්තැනට ගැළපෙන ආඛ්‍යාත පද ලියන්න.

1. ගුරුතුමිය පාඩම ..................................
2. මල්ලී වේගයෙන් .................................
3. අක්කා නුවර ...................................
4. වෙළෙන්දා සාධාරණ ලෙස බඩු ...........................
5. දැරිය මිහිරි ගීයක් ...........................